


සභාපති රසල් එම්. නෙල්සන් විසිනි

# අප එක්ව ඉදිරියට යන විට

සංස්කාරකගේ සටහන: සභාපති රසල් එම්. නෙල්සන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ 17 වන සභාපති ලෙස 2018 ජනවාරි 14 වන දින වෙන්කළ පසු, 2018 ජනවාරි 16 වන දින සෝල්ට් ලේක් දේවමාලිගාවේ ඇමුණුම් නිවාසයේ සිට සජීවී විකාශනයේදී මෙම අදහස් දැක්වීය. මෙම නිකුතුවෙහි ඔහුගේ වචන ප්‍රචාරය කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය.

දයාබර සහෝදරයිනි සහ සහෝදරියනි, මේ උදෑසන ඔබ හා සිටීම ගැන මම නිහතමානී වෙමි. දින හතරකට පෙර අපි මිනිස් යෝධයෙක් මෙන් වූ හා දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු වූ සභාපති තෝමස් එස්. මොන්සන්ගේ මෘත දේහය භූමදානය කළෙමු., ඔහුගේ ජීවිතයේ විශාලත්වය සහ අතිවිශිෂ්ටභාවයට යුක්තිය ඉටුකිරීම වචන වලට කළ නොහැකිය. ඔහු මට ඉගැන්වූදේ කෙරෙහි මාගේ කෘතඥතාවය සමග, මම අපගේ මිත්‍රත්වය සදහටම රැකගනිමි. දැන් අප මෙම සභාව අයිති අපගේ ස්වාමීන්වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත සම්පූර්ණ ඇදහිල්ලකින් යුතුව අනාගතය දෙස බැලිය යුතුය.

දින දෙකකට පෙර සෝල්ට් ලේක් දෙවමාලිගාවේ ඉහළ කාමරයේදී සියලුම ජීවත්වන ප්‍රේරිතවරු රැස්වූහ. එහිදී ඔවුහු ඒකමතික තීරණයකට එළඹුහ, පළමුව, පළමු සභාපතිත්වය දැන් ප්‍රතිසංවිධානය කිරීම සහ, දෙවනුව, මම සභාවේ සභාපති ලෙස සේවය කිරීමය. මෙම කාලපරිච්ඡේදයේදී අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් විසින් නැවත පිහිටවූ පූජකත්ව යතුරු සියල්ල උසුලන මාගේ සොහොයුරන් - මාව සභාවේ සභාපති ලෙස නම් කර වෙන්කිරීමේදී මට දැණුනු දේ ඔබට පැවසීමට තරම් වචන ප්‍රමාණවත් නොවේ. එය පරිශුද්ධ සහ නිහතමානී කරවන අත්දැකීමක් විය.

ඉන්පසු මාගේ වගකීම වූයේ මාගේ උපදේශකයින් වීමට ස්වාමීන්වහන්සේ සූදානම් කර ඇත්තේ කාවදැයි වටහා ගැනීමය. මා ඉතා දැඩි ලෙස ආදරය කරන අනෙකුත් ප්‍රේරිතවරුන් දොළොස්දෙනා අතරින් දෙදෙනෙක් පමණක් මා තෝරාගන්නේ කෙසේද?. මගේ උද්යෝගීමත් යාච්ඤා වලට පිළිතුරුදීම වෙනුවෙන් මම ඉතා ගැඹුරින් ස්වාමීන්වහන්සේට කෘතඥවන්නෙමි. සභාපති ඩාලින් හැරිස් ඕක්ස් සහ සභාපති හෙන්රි බෙනියන් අයිරින්, පිළිවලින් පළමු සහ දෙවන උපදේශකයින් ලෙස මා සමඟ සේවය කිරීමට කැමතිවීම ගැන මම ස්තුතිවන්ත වෙමි. සභාපති ඩියේටර් එෆ්. උච්ට්ඩොර්ෆ්, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ ඔහුගේ ස්ථානය නැවත භාරගෙන ඇත. ඔහුට දැනටමත් ප්‍රධාන පැවරුම් ලැබී ඇත, ඔහු ඒවාට අනන්‍ය ලෙස සුදුසුකම් ලැබුවෙකි.

ඔහුටත් සභාපති අයිරින්ටත් සභාපති මොන්සන්ගේ උපදේශකයින් ලෙස ඔවුන්ගේ විශිෂ්ට වූ සේවය උදෙසා මම ගෞරවය පළකරමි. ඔවුහු සම්පූර්ණ ලෙස හැකියාවෙන්, කැපවීමෙන් සහ දේවානුභාවයෙන් යුක්ත වූහ. අපි ඔවුන් වෙනුවෙන් බොහෝ ලෙස ස්තුතිවන්ත වෙමු. ඒ දෙදෙනාම දැන් තමන් වැඩියෙන්ම අවශ්‍ය තැන්වල සේවය කිරීමට කැමැත්තෙන් සිටිති.

ජ්‍යෙෂ්ඨත්වයෙන් දෙවනුවට සිටින ප්‍රේරිතවරයා ලෙස, සභාපති ඕක්ස් ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභාපති බවටද පත්වෙයි. කෙසේවුවද, පළමු සභාපතිත්වයට ඔහු ලැබූ කැඳවීම නිසා සභාවේ පිළිවෙල අනුව, සභාපති එම්. රසල් බැලර්ඩ්, ඊළඟ ජ්‍යෙෂ්ඨත්වයෙන් යුත් නිසා, ගණපූර්ණයේ වැඩබලන සභාපති ලෙස සේවය කරයි. පළමු සභාපතිත්වය ස්වාමීන්වහන්සේගේ කැමැත්ත වටහාගෙන උන්වහන්සේගේ පරිශුද්ධ වූ කාර්යය ඉදිරියට ගෙනයාම සඳහා දොළොස්දෙනා අත්වැල්බැඳගෙන කටයුතු කරයි.

ඔබගේ යාච්ඤා සඳහා අපි ස්තුතිවන්ත වෙමු. ඒවා අප උදෙසා මුළු ලොව පුරාම පුදකර ඇත. සභාපති මොන්සන්ගේ වියෝවෙන් පසු පළමු උදෑසන, බෙන්සන් නම් වූ අවුරුදු හතරක් වයසැති පිරිමි දරුවෙක් එවන් යාච්ඤාවක් කළේය. ඔහුගේ මව විසින්, මගේ බිරිඳවන වෙන්ඩිට ලියූ ලිපියේ උපුටාදැක්වීම් මම උපුටාදක්වමි. බෙන්සන් මෙසේ යාච්ඤා කළේය, "ස්වර්ගීය පියාණනි, සභාපති තෝමස් එස්. මොන්සන්ට ඔහුගේ බිරිඳ නැවත දැකීමට හැකිවීම ගැන ඔබවහන්සේට ස්තුතියි. අපගේ අළුත් අනාගතවක්තෘවරයා නිසා ඔබවහන්සේට ස්තුතියි. ඔහුට නිර්භීත වීමට සහ ඔහු අළුත් නිසා බිය නොවන්නටත් උදව් කරනු මැනව. ඔහුට සෞඛ්‍ය සම්පන්නව හා ශක්තිමත්ව වැඩෙන්නට උදව් කරනු මැනව. පූජකවරය ඇති නිසා ඔහුට බලය ලබාගැනීමට ඔහුට උදව් කරනු මැනව. අපට හැමවෙලාවේදීම හොඳ වන්නට උදව් කරනු මැනව."

මෙවැනි දරුවන් වෙනුවෙන් සහ ධර්මිෂ්ඨ සහ සිතාමතා තම දෙමව්පිය යුතුකම් ඉටුකිරීම කෙරෙහි තමන්ගේ කැපවීම ගැන බැරෑරුම් සේ සලකන දෙමව්පියන් සම්බන්ධයෙන් - විශාල බරවල් උසුලන නමුත් ඉතා කැමැත්තෙන් සේවය කරන සෑම දෙමාපියෙක්, ගුරුවරයෙක් සහ සාමාජිකයෙක් වෙනුවෙන් මම දෙවියන්වහන්සේට

## මාසික පළමු සභාපතිත්ව පණිවිඩය අහෝසි වීමට නියමිතය

මෙම පණිවිඩය මාසිකව පළකරන අවසාන පළමු සභාපතිත්ව පණිවිඩය වේ. අනාගතයේදී, සභා සඟරා සහ LDS.org ඇතුළු සභාවේ විවිධ වූ මාධ්‍ය තුළින් පළමු සභාපතිත්වය වැදගත් පණිවිඩ අවශ්‍ය පරිදි බෙදාගනු ලබයි.

ස්තූතිකරමි. තවත් වචනවලින් කියනවානම්, ඔබ සැමදෙනෙක්ම වෙනුවෙන්, මම ඉතාමත් නිහතමානීව කෘතඥවෙමි.

## ස්වාමීන්වහන්සේ පාලනයේ සිටිනසේක

අප එක්ව ඉදිරියට යනවිට, ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සභාව පාලනය කරන දැවැන්ත ආකාරය ගැන සිතන්නට මම ඔබට ආරාධනා කරමි. සභාවේ සභාපති කෙනෙකු වියෝවූ පසු, එම තත්වයේ ඊළඟට සේවය කිරීමට කැඳවීම ලබන්නේ කව්ද යන්න අභිරහසක් නොවේ. එහි කිසිදු මැතිවරණ ප්‍රචාරක කටයුත්තක් හෝ ඡන්ද ව්‍යාපාරයක් හෝ නැත, නමුත් ස්වාමීන්වහන්සේ විසින්ම ස්ථාපිත කළ, අනුප්‍රාප්තිය පිළිබඳ දිව්‍ය සැලැස්මෙහි නිහඬ ක්‍රියාවන් පමණක් ඇත.

ප්‍රේරිතවරයෙකුගේ සේවයේ සෑම දිනයක්ම අනාගතයේ වැඩි වගකීම් සඳහා තවත් ඔහු ඉගෙනගැනීමේ හා සූදානම්වීමේ දිනයකි. මෙම රවුමේ කණිෂ්ඨ පුටුවේ සිට ජ්‍යෙෂ්ඨ පුටුවට මාරුවීමට ප්‍රේරිතවරයෙකුට දශක ගණනාවක සේවයක් ගතවෙයි. එම කාලය අතරතුරදී, සභාවේ සෑම අංශයේම කාර්ය වල මුල් මූලාශ්‍රවල පෞද්ගලික පළපුරුද්ද ඔහුට ලැබෙයි. එමෙන්ම ඔහුට පැවරෙන කාර්යයන් ඔහුව ලෝකය පුරා නැවත නැවත ගෙනයන නිසා, ඔහු පොළවේ මිනිසුන් , ඔවුන්ගේ ඉතිහාස, සංස්කෘතීන්, හා භාෂාවන් ගැන හොඳින් දැනුවත් වෙයි. සභා නායකත්වයේ මෙම අනුප්‍රාප්තියේ ක්‍රියාවලිය අනන්‍යය. ඒ හා සමාන වෙන කිසිවක් මම නොදන්නෙමි. එය අපව පුදුමයට පත් කළයුතු නැත, මන්ද මෙය ස්වාමින්වහන්සේගේ සභාවය. උන්වහන්සේ මනුශ්‍යාගේ පිළිවලට ක්‍රියානොකරන සේක.

සභාවේ පෙර සභාපතිවරුන් පස්දෙනෙකු යටතේ දොළොස්දෙනාගේ ගණපූර්ණයේ මම සේවය කර ඇත්තෙමි. එම එක් එක් සභාපතිවරයන් එළිදරව් ලබාගැනීම සහ එම එළිදරව් වලට ප්‍රතිචාර දැක්වීම මම බලාසිට ඇත්තෙමි. ස්වාමීන්වහන්සේ සැමවිට උන්වහන්සේගේ අනාගතවක්තෘන්ට උපදෙස් දී ඔවුන්ට තමන්වහන්සේගේ අනුභාවයෙන් එළිදරව් කර ඇති සේක, උන්වහන්සේ සැමවිටත් එසේ කරනු ඇති සේක. ස්වාමීන්වහන්සේ පාලනයේ සිටිනසේක. උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ලොවපුරාම සාක්ෂි දැරීමට පත්කර ඇති අපි, උන්වහන්සේගේ කැමැත්ත දැනගෙන එය ක්‍රියාවේ යෙදවීම දිගටම කරමු.

## ගිවිසුම් මාර්ගයේ රැඳීසිටින්න

දැන්, සභාවේ සෑම සාමාජිකයෙකුටම මම කියමි, ගිවිසුම් මාර්ගයේ රැඳීසිටින්න. ගැලවුම්කරුවාණන්වහන්සේ සමඟ ගිවිසුම් ඇතිකරගෙන ඒවා පිළිපැදීම මගින් උන්වහන්සේ අනුගමනය කිරීමට ඔබේ ඇති කැපවීම සැමදෙසකම සිටින පුරුෂයින්ට, ස්ත්‍රීන්ට, සහ ළමයින්ට සෑම ආත්මික ආශිර්වාද සහ වරප්‍රසාද වලට දොරටු විවෘත කරයි.

නව සභාපතිත්වයක් ලෙස, අවසානය සිතේ තබාගනිමින් පටන් ගැනීමට අපට අවශ්‍යය. මෙම හේතුව නිසා, දේවමාළිගාවේ සිට අපි ඔබට කතාකරමු. අප හැමදෙනාගේම උත්සාහයන්හි අරමුණ ස්වාමින්වහන්සේගේ ගෘහයෙහි බලය මගින් එන්ඩව් වීමය, පවුල් ලෙස මුද්‍රාවීමය, දේවමාළිගාවේ සිදුකරන ගිවිසුම් වලට ඇදහිලිවන්තව සිටීමෙන් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ට ත්‍යාගයක් වන -සදාකාලික ජීවිතයට අපව සුදුස්සන් කරයි. දේවමාළිගාවේ ඔබ සිදුකරන වත්පිළිවෙත් සහ ඔබ එහිදී ඇතිකරගන්නා ගිවිසුම් ඔබගේ ජීවිතය, විවාහය සහ පවුල ශක්තිමත් කිරීමට සහ විරුද්ධකාරයාගේ ප්‍රහාරයන්ට එරෙහිව සිටීමට ඇති ඔබගේ හැකියාව ශක්තිමත් කිරීමේ යතුරය. දේවමාළිගාවේ ඔබගේ නමස්කාරය සහ ඔබගේ මුතුන්මිත්තන් වෙනුවෙන් ඔබ කරන සේවය ඔබගේ පෞද්ගලික එළිදරව් ලබාගැනීමේ සහ සාමයේ; වර්ධනයෙන් ඔබව ආශීර්වාද කර, ගිවිසුම් මාර්ගයේ රැඳීසිටීමට ඔබගේ කැපවීම සවිශක්තිමත් කරයි.

දැන්, ඔබ මාර්ගයෙන් ඉවත සිටීනම්, කරුණාකර නැවත එන ලෙස මාගේ හදවතේ ඇති සෑම බලාපොරොත්තුවකින්ම මම ඔබට ආරාධනා කරමි. ඔබගේ කනස්සල්ල කුමක් වුවත්, ඔබගේ අභියෝග කුමක් වුවත්, ස්වාමින්වහන්සේගේ සභාවේ ඔබට ස්ථානයක් ඇත. ගිවිසුම් මාර්ගයට නැවත ඒමේ ඔබගේ ක්‍රියාව නිසා ඔබ සහ ඉපදීමට ඇති පරම්පරාවන්, ආශිර්වාද ලබනු ඇත. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ දරුවන් රැකබලාගන්නා සේක, තවද අප හැමදෙනාම උන්වහන්සේ වෙත අප නිවසට පැමිණීම උන්වහන්සේට අවශ්‍යය. මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ දැවැන්ත ඉලක්කයකි - එනම් නැවත තම නිවස කරා යාමට එකිනෙකාට උදව් කිරීමයි.

මාගේ ගැඹුරු ප්‍රේමය මම ඔබට දක්වමි - එම ප්‍රේමය දශක ගණනාවක් ඔබ හමුවීමෙන්, ඔබ සමඟ නමස්කාර කිරීමෙන්, සහ ඔබට සේවය කිරීමෙන් වර්ධනය වූවකි. අපගේ දිව්‍යමය නියෝගය සෑම ජාතියකම, වර්ගයකම, භාෂාවකම මිනිසුන්ට ස්වාමින්වහන්සේගේ දෙවැනි පැමිණීම සඳහා සූදානම් වීමට උදව් කිරීමය. අපි මෙය ඉටුකරන්නේ ස්වාමින් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල සමගිනි, උන්වහන්සේ මෙය භාරව සිටින බව දන්නා බැවිනි. මේ උන්වහන්සේගේ කාර්යය සහ උන්වහන්සේගේ සභාවය. අපි උන්වහන්සේගේ සේවකයන් වෙමු.

සදාකාලික පියාණන් වූ දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි මාගේ භක්තිය මම ප්‍රකාශ කරමි. මම උන්වහන්සේලාව දනිමි, ප්‍රේම කරමි. උන්වහන්සේලාට - සහ ඔබට මාගේ ජීවිතයේ සෑම හුස්මකින්ම සේවය කිරීමට පොරොන්දුවෙමි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධවූ නාමයෙනි, ආමෙන්.

© 2018 by All rights reserved. Printed in USA. English approval: 6/17. Translation approval: 6/17. Translation of *First Presidency Message, April 2018*. Sinhala. 15048 408